ගොවි කටයුතු අධ්‍යයන 3(1) 1993-42-53

# මානව විද්‍යානුකූල විෂය අධ්‍යයනයක් පිළිබඳව සමාජ විද්‍යාඥයෙකුගේ නිරීක්ෂණ (1)

*රැල්ප් පීරිස් විසිනි*

පුද්ගලයෙකුට ජීවත් විය හැක්කේ එක් දිවියක් වුවද ඔහුට අන්‍යයන්ගේ ජීවිත වල පැති පිළිබඳව එක්තරා ප්‍රමාණයක "අවබෝධයක්" ලබා ගත හැකිය. පුද්ගලයකුට අනිකකුගේ ජීවිතයට "බැසගත" නොහැකිය. එවැන්නක් කළ හැක්කේ මතුපිටින් පමණි. තමනට කුළුපග අයගේ වුවද අභ්‍යන්තර සිතුවිලි වින්දනය කිරීමටද ඔහුට නුපුළුවන. එහෙත් ක්ෂේත්‍ර පර්යේෂණයෙහි දී අනුගමනය කළ යුතු "විද්‍යාත්මක" ක්‍රම වර්ධනය කර ගෙන ඇති මානව විද්‍යාඥයෝ, ජන සමූහයක් අධ්‍යයනය කරන පරීක්ෂකයා විසින් ඔවුන්ගේ චර්යා මඳ වශයෙන් හෝ අවබෝධ කර ගැනීම පිණිස ඒ ජන සමූහය අතර නිශ්චිත (නැත්නම් අනිශ්චිත) කාලයක් ගත කළ යුතු බව අවධාරණය කරති. තමන් ලබා ගන්නා දැනුම අන්‍යයන්ට ලබා දිය හැකි වීම පිණිස ඔහු ඉගෙන ගන්නා කෙනෙකුගේ තත්ත්වයෙහි සිටීම වැදගත් ය. මිනිසාත් සමාජයත් පිළිබඳ විෂය මූලික අධයයනයට බාධා වන්නේ පරීක්ෂකයා තමන්ගේ හැඟීම්වල බලපෑම ඇති වීමට ඉඩ හැරීමෙනි. ට්‍රොබ්‍රියන්ඩ් (Trobriand) දූපත් වල මිනිසුන් අතර මැලිනොව්ස්කි දීර්ග කාලයක් වාසය කිරීම නිසා - එක් අවුරුදු කාල සීමා දෙකක්, එයින් සති 06 ක් පමණි යුරෝපියයන් සමඟ හැසුරුණේ. එනෙක් මානව විද්‍යානුකූල වාර්තාවන්හි දක්නට නොලැබුණු "සැබෑ සම්බන්ධතාවන් දක්වන තොරතුරු වලින් සාරවත් වූ "වාර්තා සැපයීමට ඔහුට පුළුවන් වූයේ ය. [2] ඔහුගේ ලියවිලි වල අන්තර්ගත වූ සාරවත් විස්තර, විශේෂයෙන්ම "සැබෑ ජීවිතයේ අගය කළ නොහැකි දේ" පිළිබඳ දැනුමක් ලබා දීමට සමත්විම, ඔහුගේ ශිෂ්‍යයන්ගේ සිත් ඇදගත්තේය. ඒ ක්‍රමය අනුගමනය කළ බොහෝ දෙනෙකු විසින් නියමිත කාලයක් අධ්‍යයනයෙහි යෙදීම, වෘත්තීය මානව විද්‍යාඥයකුගේ විශේෂ ලක්ෂණයක් ලෙස සළකනු ලැබූ අතර "ම්ලේච්ඡයන්" අතර ගත කරන කාලය දීර්ඝ වූ පමණට, කෙනෙකුගේ පරිශ්‍රමයේ ප්‍රතිඵල වඩාත් පැහැදිලි වන බවත් විද්‍යාත්මක වන බවත් සළකනු ලැබීය.

මුල්ම බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයන්ගේ බුද්ධිමය පසුබිම ආත්ම - තෘප්තියෙන් යුත් මධ්‍යම පංතික එකක් වූයේ ය. ස්වකීය සමාජයත්, සංස්කෘතියත්, සර්වභෞමික නොවේ නම් යටත් පිරිසෙයින් ඉතාම ස්වාභාවික වූවක් සහ උචිත වූවක් ලෙස සැළකූ වික්ටෝරියානු බුද්ධිමතුන්ගේ පටු දෘෂ්ඨිය, විවිධ ගෝත්‍රිකයන් ගෙන් සහ ජාතීන් ගෙන් සැදුණු විශාල යටත් විජිත ආධාර රාජ්‍යයන් උරුම වීමෙන් ද තුරන් වූයේ නැත. ඔවුන්ගේ ආත්ම තෘප්තිය සොලවා ලීමට, සංචාරයෙහි නොයෙදුණවුන් එල්බ ගෙන සිටි විරාගත චින්තන වඩාත් ග්‍රහණශීලි වූත් විෂය මූලික වූත් මානසික තත්ත්වයකට පරිවර්තනය වීමට, ස්වකීය සමාජයේ චින්තන ක්‍රමයෙන් ප්‍රතිකාරාත්මක ඈත් වීමක්, මනෝවිශ්ලේෂණ වෛද්‍ය වරයකුට ආත්ම විශ්ලේෂණය මෙන්, මනෝ විද්‍යාඥයාට ද වැදගත් වන බව සළකනු ලැබීය. සමාජයක් විෂය මූලිකව අධ්‍යයනය කළ හැකි වන්නේ ඒ සමාජයෙන් බාහිර වූ කෙනෙකු විසිනිඃ යන මතය අද සළකනු ලබන්නේ යුක්ති යුක්ත නොවූවක් ලෙසය. මානව විද්‍යාඥයෝ ආත්ම තෘප්තියට පත් වූවෝ නොවේ. උගත් කෙනෙකුට බාහිර සමාජයන් පිළිබඳ ප්‍රමාණවත්ව කියවා තමන්ගේ සමාජය දෙස අපක්ෂපාතව බැලිය හැකි ය. එහෙත්, තමන්ගේ සමාජය පිළිබඳ සිය අවබෝධය ගැඹුරු කර ගැනීම පිණිස තමන්ගේ සමාජයෙන්

අනිවාර්යයෙන්ම ඇත්වීම, හුදෙක් විද්‍යාත්මක හේතූන් විසින් නියම කරනු ලැබුවක් පමණක් නොව ගැඹුරු භාවමය වැදගත් කමක් ඇති පිළිවෙතකි. මානව විද්‍යාවේ ආධුනිකයකු වශයෙන් ඇතුල් වී යමෙක් "පුහුණු" මානව විද්‍යාඥයන්ගේ මනෝඥ කණ්ඩායමට පිවිසීමේ පිළිවෙතක් වශයෙන් කිසියම් කාලයක් ක්ෂේත්‍ර වැඩෙහි යෙදීමට ඇත්වීම අවශ්‍ය යැයි යන අදහස ඉදිරිපත් වී තිබේ. එහෙත්, බොහෝ විට දුරස්ථ වීම අසම්පූර්ණ වීමේ දුකින් පෙළෙන මානව විද්‍යාඥයෝ, නියමිත කාල සීමාවකින් (වෂී දෙකක් පමණ) ලබන "අවබෝධයේ" ප්‍රමාණය සියල්ලන්ටම එක සමානය යන බොළඳ විශ්වාසයෙන් සැනසුනහ.

නමුත්, පුද්ගලයන්ගේ ග්‍රහණ ශක්තීන් සහ සංවේදනීයත්වයන් අතර, නිසැකවම වෙනස්කම් ඇත. එක් කෙනෙකු මසකින් ඉගෙන ගන්නා දෑ සහ සමාර්ථයක් ඇත්තෙක් සතියකින් උගනී: තවත් කෙනෙකුට මහ හැරී යන සුළු දෑ නිරීක්ෂණය කළ නොහැකි වනු ඇත. ඒ නිසා ආචාර්ය ඊ. ආර්. ලීච්, ලංකාවේ වියළි කලාපයේ ගමක පවතින ඉඩම් භුක්ති සහ නෑ සබඳකම් පිළිබඳව ලියා ඇති අගනා කෘතියෙහි වියළි කලාපයේ වෙනත් කොටසක ඔහුගේ ඇසුරෙහි සිටින ආචාර්ය එන්. ම්. යල්මන් ගත කළ මාස 15 පිළිබඳ ගෞරවාන්විතව සඳහන් කල අතර, පුල් - එලිය නමැති ග්‍රාමය පිළිබඳ අධ්‍යයනය සඳහා ඔහු ගත කළ මාස 06 ට සීමා වූ කාලය, "නියම විද්‍යාත්මක අගයක් සඳහා ඉතා සීමිත වන බැවින්" එය ප්‍රකටවම විවේචනයට ලක්වන බව ඔහු පිළිගැනීම මට තේරුම් ගත නොහැකිය. ඔහුගේ පිළිගැනීම තිබෙන කාලයෙන් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම පිළිබඳ පරිශුද්ධවාදී මතයේ (Puritan doctrine) ප්‍රතිරාවයක් නොව තමන්ගේම සමාජයේ දුරස්ථ වූකාලය සෑහෙන්න දීර්ඝ නොවීමේ සහ සම්පූර්ණ නොවීමේ වරද පිළිබඳ හැඟීමෙන් ඇති වූ චිත්ත වේදනාවකි. වෙහෙසට පත් වූ මානව විද්‍යාඥයකු විසින් හෙමිහිට ගමෙන් පිටත් වී මෝටර් රියකින් සැතපුම් කීපයක් ඈතින් පිහිටි තානායමකට ගොස් එහි නාගරික පරිසරය මධ්‍යයෙහි යමක් පානය කිරීම නිසා විඳිනු ලබන සිත් වේදනාව කෙබඳු දැයි කෙනෙකුට සිතා ගත හැකිය. ඔහු තමන්ට නියම කර ගත් මාස හයක් කාලය තුළ හුදකලාව වෙත්වී සිටීම කඩ නොවිය යුතු බැව් ඔහු සිතයි. මානව විද්‍යාවේ පුරෝගාමීන් විසින් පිළිගනු ලැබූ පරිදි අවුරුදු දෙකක කාලයක් තුළදී මාස 06 ට වැඩි කාල ප්‍රමාණයකින් එය ඇත්ත වශයෙන්ම කඩ නොවිය යුතුය.

පැහැදිළි නොවූ, තේරුම් ගත නොහැකි දේ පිළිබඳ අවබෝධයක් ඇති කර ගැනීම කෙරෙහි ඉතා අධිකව සැළකිලිමත් වීමේ තර්කානුකූල ප්‍රතිඵලය වන්නේ තමන් ආත්මීය ඥානයටම සීමා වීමය. එම මූලික කාරණය පිළිබඳ අවබෝධය විසින් විෂය බද්ධව පැහැදිලි කළ හැකි පර්යේෂන ක්ෂේත්‍ර නියම කර ගැනීමට මානව විද්‍යාඥයෝ පොළඹවනු ලැබූහ. එහෙත් කිසිම නිශ්චිත පරමාර්ථයක් නොමැතිව හැකි පමණ තොරතුරු එකතු කිරීමේ අදහස යල් පැන ගිය එකක් වුවද, එය අභාවයට යන්නේ ඉතා සෙමිනි. එය, මානව විද්‍යාව පිළිබඳ සටහන් සහ ප්‍රශ්ණ (Notes and Queries on Anthropology) නැමැති ග්‍රන්ථයෙහි වරින් වර පළ වූ සංස්කරණයන්හි අනුමත කර තිබේ.

ඇත්ත වශයෙන්ම, බොහෝ ප්‍රකට විද්වතුන් විසින් ක්ෂේත්‍රයට ගිය එක් ගමනකදී රැස්කරගත් දත්ත පදනම් කරගත්, පොත් සහ ලිපි ලේඛණ ගණනාවක්ම පළ කැර තිබේ. ඔවුහු දශකයකට පමණ පෙර, මාස කීපයක් පමණ ගත කළ සමාජය ගැන විනා වෙනත් සමාජයක් ගැන නොදත්හ. මෑත දී තමන්ගේම සමාජය තුල පර්යේෂනයෙහි යෙදීම

වෘත්තීය චාරිත්‍ර විසින් වළකනු ලබන තෙක්, යථෝක්ත ක්‍රම ඔවුන්ගේ ජීවිතයේ අත්දැකීම වූයේ ය. (මානව විද්‍යාඥයන්ගේ ගණයට ඇතුළත්වූ එක් අවංක කාන්තාවකට, ප්‍රධාන බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක සමාජ ව්‍යුහය පිළිබඳ කථා පෙළක් පැවැත්වීමට ආරාධනා කළ විට, ඇ අවධාරණයෙන්ම කියා සිටියේ තමන් අධ්‍යයනය කළ එක් සමාජයක් ගැන පමණක් කථා කළ හැකි බවය.) මානව විද්‍යාඥයාගේ සටහන් පොත්වලට "සිත්ගන්නා" තොරතුරු රාශියක් ඇතුලත් වූවද, නිදසුන් වශයෙන්, උරුමකරුවෙකුගේ ස්ත්‍රී පුරුෂ භාවයේ වැදගත් කම[9] දැන් ප්‍රවණතාවය වී තිබෙන්නේ පර්යේෂනය සඳහා අනුමත එල්ලයන්ට පමණක්, විශේෂයෙන්ම නෑ සබඳකම් (Kinship) සහ ඉඩම් භුක්තිය වැනි සමාජ ක්‍රමයේ වඩාත් "ව්‍යුහගත" අංශයන්ට, තමන් සීමා වීමය. පර්යේෂණයේ එල්ලයන්ගේ (foci) මේ ව්‍යුහකරණය විසින් මානව විද්‍යාඥයන්ගේ බලාපොරොත්තු වන සහභාගිත්වයේ කාලයක් තීව්‍රත්වයෙන් අඩු කර තිබේ.

මානව විද්‍යාඥයින්ගේ පර්යේෂන වලදී තොරතුරු සපයන්නා විසින්, බොහෝ විට පිළිගනු නොලබන ඉතා වැදගත් කාර්යයක් ඉටු කර තිබේ. ඇතැම් විට, ඔහු ක්ෂේත්‍රයෙහි වැඩ කරන්නාට[10] නොරිස්සන්න පුලුවනි: එහෙත්, ක්ෂේත්‍රයෙහි ගත කළ යුතු කාලය අඩු කිරීමටත්, දේශීය භාෂාව පිළිබඳ දැනුමක් ලබා ගැනීම අනවශ්‍ය කරවීමත්, හැරුණු විට සෘජු සහභාගිත්වය නිසා ඇති වන වෙහෙස පීඩාව අවම කිරීමට හෝ එයින් මිදීමට හෝ ඔහුට උපකාර විය හැකිය. පරිවර්තකයකුගේ සේවය උපයෝගී කරගත් බවත් ආචාර්ය ලීච් සඳහන් නොකරන බැවින් ඔහු ගැමියන්ට ආරෝපනය කර තිබෙන ඇතැම් ප්‍රකාශන සහ මත වලින් හැඟෙන්නේ කර්තෘ සිය පරීක්ෂණයට භාජනය කළ ගැමියන් සමග කිට්ටු සබන්ධයක් පවත්වා ගත් බවය. එහෙත් ඔහු කියන තරමටම පාඨකයන්ට අවංක වී තිබේද? අනිත් අතින් රයන් (Ryan)[12] "මෙහෙයවන ලද ශිෂ්‍ය ව්‍යාපෘතියක්" වශයෙන් ආරම්භ වී සිංහල ගමක් පිළිබඳ ඔහුගේ අධ්‍යයනයට මුලින් සහාය වී, පසුව උපාධි ලබාගෙන අධික ලෙස සහාය වෙමින් ඔහු සමග වැඩ කළ දේශීයයන් දෙදෙනෙකුගෙන් ලැබුණු උපකාරය ඔහු අගය කරයි: ඔවුන් දෙදෙනාගෙන් ලැබුණු සහාය සම කර්තෘ මට්ටමක පැවතුණි. ඒ හැර ගමේ තවත් සතර දෙනෙක් අපේ උපදේශකයන්, තොරතුරු සම්පාදකයක් සහ සහයෝගීව ක්‍රියාකරන්නන් වශයෙන් කටයුතු කළහ. "එවැනි සහභාගිශීලි නිරීක්ෂකයන්ගේ සම්බන්ධය පැහැදිලිවම සෘජුව කරනු නොලබන හෝ පවරනු ලැබූවක ස්වරූපයක් ගත හැකි ය.[13]

තොරතුරු සපයන්නන් (informants) පරිවර්තකයන් (inter preters) සහයෝගීව කටයුතු කරන්නන් (Collaborators) යන විවිධ නම් වලින් හඳුන්වනු ලබන මැදිහත් වන්නා, සුපුරුදු වශී කිරීම් අනුව, බාහිර සමාජ පිළිබඳ පද්ධතිය හැකි පමණින් අවබෝධයක් ලබා ගැනීම පිණිස මානව විද්‍යාඥයා විසින් උපයෝගී කරගනු ලබන බළල් අතයි. මෙලෙසින් රයන් 14 (ගෘහයා යන වාච්‍යාර්ථය ඇති) සිංහල "ගේ" යන පදය "පීතෘ මූළික පවුල්" (Patrillimal) family) යනුවෙන් පරිවර්ථනය කර මැසචුසෙට්ස් (Massachussettes) ප්‍රදේශයේ බොස්ටන් (Boston) හි මැක්ගින්ටීස් (MacGinty) හෝ ලොජ් (Lodge) හා සම කරයි. ඇමෙරිකානු පවුල ගැන දන්නා අයට ඒ සැක සහිත අර්ථ නිරූපනය සතුට දායක විය හැකි වුවද එයින් සිංහල සංකල්පය පැහැදිලි නොකරයි. වියළි කලාපයෙහි ස්වීය කුළය තුළ පමණක් අවාහ විවාහ සිදුකර ගනු ලබන එක්තරා ප්‍රමාණයකට මිත්‍යා ඥාති සමූහයක් වන "වරිගෙ" පිළිබඳ ආචාර්ය ලීච් ගේ දීර්ඝ විග්‍රහය ද (රයන්ට වඩා) බෙහෙවින් සාර්ථක වූවක් නොවේ.[15] නමුත් ඔහු ග්‍රාමීය ඉඩම් අයිතීන් හවුල් ව්‍යාපාර සමාගමක කොටස් හිමිකම හා සම කිරීම ඇත්ත වශයෙන්ම උචිත ය.[16]

නිරීක්ෂිත කරුණු වල ප්‍රමාණය සීමා කිරීමේත් තොරතුරු සපයන්නන්ගේ සේවය ලබා ගැනීමේත් අනිවාර්ය ප්‍රතිඵලය වනුයේ සැහැල්ලු කරුණුවලට මානව විද්‍යාඥයා කළ ඇති රුචිය නැති වී ගොස් ප්‍රමාණාත්මක සහ මැනිය හැකි කරුණු සෙවීමට ඔහු නැඹුරු වීමය. (සමාජ විද්‍යාවේ ක්‍රමය ලෙස ඔහු වරදවා පිළිගත හැකි) සංඛ්‍යාත්මක සමාජ සමීක්ෂණය (statistical Social Survey) හෙලා දැකීම ඔහුගේම ක්‍රම විද්‍යාත්මක ගැටළු (methodological dilemmas) නිරාකරණය කර ගැනීමට උපකාර නොවන තරම් ය. දිගු කාල ප්‍රමාණයක සහභාගිශීලි - නිරීක්ෂණයන් ගෙන් ලබා ගන්නා සම්බන්ධතා ආකෘති (relational configurations) කෙරෙහි සැළකිලිමත් වන මානව විද්‍යාඥයාගේ ක්‍රම සසඳමින් සමාජ විද්‍යාඥයාගේ ක්‍රම සංඛ්‍යාත්මක බැව් ලීච්[17] කලින් ලියූ ලිපියක මෑදුව ප්‍රකාශ කරයි. ඉතා මෑත දී ඔහු පල කළ ලිපියක "එක් අධ්‍යයන යක ප්‍රමාණාත්මක (සංඛ්‍යාමය) සාධක පිරික්ෂා, එහි උත්කෘෂ්ඨ ආදර්ශනය කින් තොර වූ ව්‍යුහමය රටාවක් ඇති බව ප්‍රකාශිතය.[18] ඇත්ත, නොයෙක් විට, සියලුම අවස්ථා ඔහු සරලව ගණන් කිරීමෙහි එනම්: කොටහලු මංගල්‍යයකට ආරාධනා කරනු ලබන සහ ආරාධනා නොකරනු ලබන නෑයන්,[19] වත්මාන විවාහ,[20] අයත් ඉඩම් වල ප්‍රමාණයන්,[21] ආදිය ගිණීමෙහි යෙදේ.

නමුත් සෙසු සාධක ඉදිරිපත් කරන්නේ ප්‍රමණාත්මකව නොවේ. මෙලෙස, හත් වාරයක් "විවාහ" වූ තරුණ කතගේ නිදසුන, එයින් තෙවරක් එකම සැමියා සමග එක් අන්තයක් ලෙස දක්වතත්, එය අද්විතීය එකක් සේ නො සැලකේ. එහෙත් එය අද්විතීය නො වුවද, කර්තෘ කියන පරිදි ඔහුගේ දත්ත ප්‍රමානාත්මක නම්, ගමෙහි සැම පුද්ගලයකු (හෝ නියෝජනාත්මක කොටසක්) විවාහ වන වාර පිළිබඳ සංඛ්‍යාත්මක ගිණුමක් බලාපොරොත්තු විය යුතුය. ඒ වාර ගණන සාමාන්‍ය සංඛ්‍යාවක් වශයෙන් සඳහන් කරන්නේ නම් (නැතහොත් සම්මත අප ගමන (Deviations) ගණිනු ලැබුවොත්) අප පත් වන්නේ විවිත්ත ක්ෂේත්‍රයකටය. (realm of the abstract) එයින් හැඟෙන්නේ මූර්ත පුද්ගලයෙකුට (concrete individual) වාර තුන හමාරක් විවාහ විය නොහැකි බවය.

ආචාර්ය ලීච් විශේෂතාව (speciticity) සහ විවික්තතාව (abstraction) වශයෙන් දක්වන අස්වාභාවික බෙදීමෙන් මතුවන උග්‍ර ගැටළුවක් ඇත. "කරුණු පැහැදිලි කිරීමට" ඔහුගේ සාක්ෂි වලට ඉඩ හැර තිබෙන බව කියා පාමින් ඔහු තම සගයන් (colleagues) ඔවුන්ගේ පාඨකයන්ට අවංක වීමට දැරූ උත්සායට වඩා[23] ඔහුගේ පාඨකයන්ට අවංක වී ඇති බැව් හැඟවීමට තැත් කරයි. ඔහුගේ චෝදනාවෙන් වැඩියක්ම පෙනෙන්නේ, ප්‍රායෝගික යථාර්ථයේ සංකීර්ණත්වයට හානිකර වන්නට ඇති කල්පිත විස්තර (ideal accounts) ඒ අතින් අය විසින් ඉදිරිපත් කර ඇති බවය. මිනිසුන් උපයෝගී කර ගන්නා සංකල්පයන්ට වඩා ඉතා නිවැරදි විශ්ලේෂණාත්මක සංකල්ප (analytic catgories) අනුව සමාජ ව්‍යුහයක් විවරණය කිරීමට කෙනෙකු තැත් කර තොත් සැබෑ ජීවන තත්ත්වයෙහි[25] නොදකින ව්‍යාජ දැඩි බවක් සහ සංමිතියක් (symmetry) ඒ සමාජ ව්‍යුහයට ඇතුල් කරති"යි ඔහුගේ මෑත ලේඛණයක් තර්ක කර තිබේ. ඊට විසඳුම වන්නේ පරමාදර්ශයකට (ideal paradigm) අනුකූල නොවූ ව්‍යුහමය රටාවක් ප්‍රදර්ශනය කරන බව පෙන්වීමට කිසියම් ඒකකයක් පිළිබඳ "සංඛ්‍යාත්මක" සාධක පිරික්සමින් මානව විද්‍යාත්මක වාර්තා හැකි තරම් සවිස්තර කිරීමය. අවසානයේ දී, සුපරීක්ෂාකාරීව කරනු ලබන විස්තරයකින් අනාවරණය වන්නේ හුදෙක්ම එක් රටාවකි.

දැන්, ඔවුනොවුන්ට බලපාන පුද්ගලයන් 167 දෙනෙකු වාසය කෙරෙන එක්ගමකින් සැදුණු සීමිත ලෝකයෙහි, ඇතැම් වැදගත් සම්බන්ධතා සහ ක්‍රියාවන් සිදුවන අවස්ථා

ගණන් කිරීම ගණිත ශාස්ත්‍රය අනුව කළ හැකි වේ. එහෙත් නිවැරදිව නොවේ. පුද්ගලයන් දෙදෙනෙකු අතර පවත්නා අන්‍යොන්‍ය බලපෑම් (නැතහොත් චරිත සම්බන්ධතා දෙකක් (two role relationship) "දළ සමානත්වයක්" පමණක් බව පිළිගනු ලැබේ. එසේ නම්, පිරිමි දෙදෙනෙකු අතර බලාපොරොත්තු විය යුතු "චර්යා[26] ලැයිස්තුව පරම ආදර්ශ බවට පත් වේ. සැකෙවින් කියතොත් සැබෑ චර්යාවක් පිළිබඳ සෑම වාචික විස්තරයක, පුද්ගලයෙකුගේ විශේෂ ක්‍රියාවන්ට සම්බන්ධයක් නැත්නම්,පරම ආදාර්ශයකගේ කිසියම් කොටසක් එයට ඇතුළත් වේ. එහෙත් ප්‍රමාණවත් අවස්ථා සංඛ්‍යාවක් පිළිබඳ නිරීක්ෂනය පදනම් කරගෙන අප ඉදිරිපත් කරන මේ නියත චර්යා, අපගමන කීපයක් හේතු කොටගෙන සාවද්‍ය බව සනාථ නොවේ. ප්‍රශ්ණයේ ගැටළුව එමට් (Emmel) සඳහන් කරන්නේ මෙසේයි.

> විග්‍රහ කරනු ලබන විවිධ චරිතයන්ට අනුකූල යැයි පිළිගනු ලබන චර්යා මගින් කෙරෙන සාධාරණීකරණ විසින් විවිත්ත වගී (abstract types) සකස් කරනු ලැබේ.
>
> ඒ ආකාරයට පුතකු වශයෙන් හෝ ගම් විදානයකු වශයෙන් නොහැසිරෙන බැවින් ඒ වගී පරම කල්පිත වේ: නමුත් පුතුන් හෝ ගම් විදානයන් හැසිරිය යුතු අයුරු මිනිසුන් සිතන්නේ කෙසේ දැයි ඒ වගී දළ වශයෙන් විග්‍රහ කෙරේ. එය ගම් විදානයකු සාමාන්‍යයෙන් හැසිරෙන ආකාරයෙන් කිසිසේත්ම ඈත් නොවේ.[27]

සියුම් විස්තර සහිතව වාර්තා කර ගනු ලැබූ සාධක කිසියම් රටාවක් විදහා දක්වතියි යන බොළඳ ප්‍රායෝගික මතය තහවුරු කළ නොහැක්කක් බව මම ප්‍රකාශ කරමි අනාවරණය වන රටා පරම කල්පිතය. ස්වකීය සගයන්ට එරෙහිව ඔහුම ප්‍රකාශ කරණ "වක්‍රොක්ති" (Insinuation) ආචාර්ය ලිච්ට පැහැදිලිය. "ප්‍රබන්ධ (fiction) උපයෝගී කර ගනිමින්, පරම සංකල්පයන්ට ගැලපෙන සේ සිය සාධක සකස් කරගෙන ඇතැයි කියමින් ඔහු එවන්ස් ප්‍රිචාර්ඩ් (Evans Pritchard) සහ පොර්ටේස් (Fortes) වැනි ලේඛකයන්ට චෝදනා කරයි.[28] ඒ වගේම ඔහුත් ප්‍රබන්ධ වලට (Fictions) නැඹුරු වී ඇති බවත් එය ඔහුගේ දක්ෂ වාග් හරඹ මගින් පාඨකයන්ට වසන් කිරීමට අසමත් වී ඇති බවත් මම කියා සිටිමි නිදසුන්: සැබෑ චර්යා පරම කල්පිත රටාවන්ට (idealized patterns) දළ වශයෙන් සමීප හැසිරීම් වේ. ඔහුගේ ප්‍රධාන තර්කයෙහි පරස්පර විරෝධිත්වයක් දක්නට ලැබේ. හේතුව, ඔහු පිළිගන්නා චර්යා (නිදසුන් වශයෙන්, පිරිමි යුගල අතර චරිත සබඳතා), ප්‍රායෝගික යථාර්තයේ විස්තරවලට සම්පූර්ණයෙන්ම අනුකූල නොවන නිසා, දැඩි ආකෘති වේ. එවිට, ඒවා හුදෙක්ම චින්තන මාත්‍රයක්, පරම කල්පිතයන්, ප්‍රබන්ධයන් විය හැකිය.

මෙහි ප්‍රධාන කාරණය නම් සමාජ සාධක විස්තර කිරීමේ දී කෙනෙකුට වැඩියෙන් හෝ අඩු පමණින් විශේෂ විය හැකි වීමය. ගවයන් කේන්ද්‍ර කරගෙන සැදුණු මුඛ්‍ය ලැදියාවන් ගෙන් යුත් ගෝත්‍රයක් විස්තර කරමින් එවන්සි ප්‍රිචාර්ඩ් මෙසේ සඳහන් කළේය.

නුඅර් (Nuer) ගෝත්‍රිකයෙකු ගවයකු ගැන සඳහන් කරන විට ඔහුගේ සුපුරුදු උදාසීන ස්වභාවය ඉවත් වී උගේ අං හැඩගැසී ඇති ආකාරය පෙන්වීමට අත් විසුරුවමින් උනන්දුවෙන් ඔහු කථා කරයි. "මට හොඳ ගොනෙක් ඉන්නවා. පිටේ ලොකු ලපයක් ඇති, මුව උඩින් ඇඳුණු එක් අහක් ඇති වයිරම් ගොනෙකි"යි ඔහු කියයි. එසේ කියමින් ඔහු

අත් දිගු කරයි. එක් අතක් හිස උඩින් දික් කර අනිත් අත වැලමිටෙන් නවා ඔහුගේ මුව ඉදිරියෙහි තබයි.[29]

මෙය කර්තෘගේ ලේඛණයන්ට සුවිශේෂ වූ "සුන්දර පැහැදිළි බවක්" ඇතිව ප්‍රකාශිත කල්පිත කියමනකි, (abstrct-statements) සාධාරණීකරණයකි. ලීච් කියන අන්දමට ඒ "සුන්දර පැහැදිලි බව" ඇති වන්නට හැකි වූයේ ඇතැම් පරම කල්පිත වර්‍ගයේ අවස්ථාවන් පිළිබඳ වර්‍ණනයන් පමණක් එවන්ස් ප්‍රිචාඩ් තමන්ට සීමා කර ගත් නිසාය.[30] අනිත් අතින්, මම ඒ සිත්කලු ශෛලිය ආරෝපනය කරන්නේ, අවස්ථාවෙහි අන්තර්ගත යමකට වඩා වියුක්ත කාල්පනිකත්ව ප්‍රමාණයටය. තවද, ඉහතින් උපුටා දැක්වූ වියුක්ත කියමන නුවර් (Nuer) ගෝත්‍රයේ සෑම පුද්ගලයකුගේ හෝ නියෝජ්‍ය කොටසකගේ හරි ප්‍රතිචාර විධි සංඛ්‍යාමය විවරණයකට පරිවර්තනය කිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් සිදු නොවේ. එසේ වුවද, අවංකව වෙහෙසෙන කෙනෙකු ඒ විධියටම ක්‍රියා කර, "ගවයන් පිළිබඳ පැණයකට ගෝත්‍රිකයන් ගෙන් 4.7% ක් ප්‍රතිචාරය දැක්වූයේ අත් ඔසවන්නේ නැතිව උද්යෝගිමත් විරිත්තීම කින් හෝ එවන්ස් ප්‍රිචාර්ඩ් විසින් විස්තර කරන ලද පරිදි කතා කරමිනියි යනුවෙන් වාර්තා කළ හැකි ය."

ප්‍රශ්ණය නම් සීමා කිරීම සිදු විය යුත්තේ කොතැන ද යන්නයි. අපට අවශ්‍ය වන්නේ පිරික්සුමට ලක්වන ඒකකය දෙස සමස්තයක් වශයෙන් බැලීම නම්, විස්තර ඉතා අධික වීමෙන් සම්පූර්ණ චිත්‍රය අපහැදිලි විය හැකිය. බිලියඩ් බෝලයක් දෙස වුවද, කිසියම් සමීප දුරක සිට සූක්ෂම දර්ශනයක් (microscopic) මගින් බැලුවොත් එය සමව නොපෙනේ. මගේ විරෝධය පාන්නේ, හිතුමතයේ විශේෂත්ව ප්‍රමාණය තීරණය කරගෙන "මා සීමා වන්නේ මෙතැනටය: එබැවින් මෙතැනට එය සීමා කළ යුතු"යි යන නියමයන් පෙන්වන ප්‍රවේශයන්, (approach) නොඉවසීම සහ මතයකට දැඩිව එල්බ ගැනීමටය. විෂය මූලික නිර්නායකයන් (objective criteria) ඉදිරිපත් කෙරෙන්නේ නැත: නිර්නායකයන් කිසිවක්ම නැති හෙයිනි. මානව විද්‍යාවේ පුරෝගාමීන් අතර, විශිෂ්ඨතමයෙකු ලෙස සැළකෙන රැඩ්ක්ලිප් බ්‍රවුන් (Radcliffe Brown) වරක් පැවසූ පරිදි ඒකක තෝරා ගැනීමෙ ද අනුගමනය කළයුතු උපදෙස් මාලාවක් නොතිබිණි: "අනුගමනය කරනු ලබන ක්‍රමයෙහි අත්තනෝමතික ගතියක් ඇත. එකම ප්‍රශ්ණය වන්නේ ඔබ යෝග්‍ය පරිදි හෝ යෝග්‍ය නොවන පරිද ක්‍රියා කරන්නේ ද යන්නයි. අධ්‍යයනය කිරීමෙන් පසුව එහි ප්‍රතිඵල දකින තුරු ඔබගේ වියුක්ත කල්පිතය යෝග්‍ය වූයේ දැයි කියන්නට නුපුළුවන් බව සිතේ"[31]

ආචාර්ය ලීච් කියා සිටින පරිදි ඔහුගේ විෂය අධ්‍යයනයේ "අධික විස්තර" (excessive details) ගැන ඔහු සතුටු වන්නේ නම්, මගේ "සිංහල සමාජ සංවිධානය" (Sinhala Social Organization) නැමැති ග්‍රන්ථයෙහි වියළි කලාපයේ ගම ගැන කර තිබෙන වියුක්ත විවරණය පිළිබඳව මමත් ඒ තරමටම සතුටු වෙමි: ඒ කෘතියේ පරමාර්ථය වූයේ තිබෙන සාධක මගින් සමස්ත රාජධානියක පැවති සමාජ ක්‍රමයක් ආදර්ශන යයි. (model) එක කල්පිත (abstract) වියළි කලාපීය ග්‍රාමය පිළිබඳ විස්තර එක් කොටසක් පමණි.[32] එය තවත් කල්පිත (abstraction) කර කියවීමට පහසු කළ හැකිව තිබුණි. නමුත් තිබුණ ඓතිහාසික දත්ත විසින් ආචාර්ය ලීච් ගේ සමකාලීන ගමක් පිළිබඳ අධ්‍යයන යෙහි මෙන් "අධික විස්තර" ඉදිරිපත් කිරීම වලකනු ලැබීය.

බොහෝ මානව විද්‍යානුකූල විමර්ශන යන්හි කල්පිත ප්‍රමාණය පිළිබඳ නිගමන

නිශ්චිත කරනු ලබන්නේ රැඩ්ක්ලිප් බ්‍රවුන් (Radcliffe Brown) නිර්දේශ කළ සාමාන්‍ය ඥානය විසින් නොව තම සගයන්ට (Colleagues) වඩා වෙනස් බව පෙන්වීම පිණිස "හිස් දඬයමක" යෙදීමට ඇති මැඩලිය නොහැකි ආශාව විසිනි. මෑන් (Man) නැමැති කෘතියේ පසු පිටු අලංකාර කරන තරුණ මානව විද්‍යාඥයන් අසභ්‍ය ලෙස හෙළා දැකීම් වෙනුවට මෙහි ඇත්තේ සියුම් වූත් උදාර වූත් වක්‍රෝක්තියෙන් දොස්කීම් බව පැවසීමට මෙහිදී මම යුහුසුළු වෙමි. මේ බුද්ධිමය පරිසරයේ භයානක කම, නම් ඕනෑම විවරණයක් කල්පිත ය (ideal) යන චෝදනාවට ලක් වීමය. ආචාර්ය ලීච් අතිශයෝක්තියෙන් ඉල්ලුම් කරන "අධික විස්තර" බෙහෙවින්ම අඩුපාඩු සහිත බව පෙන්විය හැකිය. ඇතැම් පිරිමි ඥාති චරිත යුගල අතර අපේක්ෂා කරනු ලබන "කල්පිත" චර්යා ඔහු ඉදිරිපත් කර ඇත; නමුත්, පිරිමි සහ ගැහැණු අතර පවතින මූලික සබඳතා පිළිබඳ ඒ හා සමාන තොරතුරු ඔහු ඉදිරිපත් කර නැත. අඹු සැමියන් අතර පවත්නා සම්බන්ධය ද සවිස්තරව සළකා බලා නොමැත. එසේ වුවද, බිරිඳට පහරදීම්, පරදාර/පරපුරුෂ සේවනය ආදිය පිළිබඳ තොරතුරු අතිශයින්ම වැදගත් විය හැකිව තිබුණි. "විවාහ" කල්පිත ක්‍රමයකට (abstract - manner) විස්තර කර ඇති අතර එදිනෙදා කටයුතු වලදී බිරිඳ ගන්නා තැන නොසලකා හැර තිබේ. එම සමාජ ක්‍රමය පිළිබඳ කර තිබෙන වියුක්ත නිරූපනය (abstract - presentation) ඉතාම දක්ෂ වූත් බෙහෙවින් සිත් ගන්නා සුළු වූත් එකක් වුවද ආචාර්ය ලීච් එය ඉදිරිපත් කර ඇත්තේ පිරිමියාගේ දෘෂ්ටියෙනි. එය "ලංකාවේ ඉඩම් භුක්තිය සම්බන්ධව දැනට තිබෙන තරමක විශාල පොත් පත් සංඛ්‍යාවට තවත් එකතුවක්" බව මා සැක නොකරන නමුදු, බලාපොරොත්තු නොවූ යමක් එහි තිබේ දැයි මම අසමි. ඇත්තෙන්ම එය, දැනට පවත්නා දැනුමෙහි වෙනසක් ඇති නොකර එය පුළුල් කිරීමට උපකාර වන එකතුවකි.

"සමකාලීන බ්‍රිතාන්‍යය සමාජ මානව විද්‍යාවේ සිද්ධාන්ත සහ ක්‍රමවල ඇතැම් අංග අතිශය වැදගත් පිරික්සුමට ලක් කිරීමට උත්සාහ කර තිබෙන තැන්වල "පුල් එලිය" නැමැති කෘතිය සාර්ථක වී ඇත්තේ ඊටත් අඩුවෙනි.[33] බොහෝ විට "ඉතා වැදගත් පිරික්සුම්" යනුවෙන් අදහස් කරන දෑ මවිතකරන ප්‍රායෝගික දත්ත මහ ගොඩක යටපත් වූ ශාස්ත්‍රීය වාදයකට (academic polemics) වඩා වැඩි යමක් නොවේ. සාධක ඉදි කර තිබෙන්නේ ආචාර්ය ලීච් තර්ක කරන පරිදි "සාමාන්‍ය ගණයක ලා ගැණෙන කිසියම් බොළඳ සිද්ධාන්තයක්" පැහැදිලි කර දීමක් හැටියට නම් එය තදින් සැලකිල්ලට ගත නොහැකිය. එයත් මානව විද්‍යාඥයාගේ "පෞද්ගලික ප්‍රතිභානයේ" (private intuition) නිමැවුමකි. ඇතැම් බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයන් විසින් සොයා ගෙන තිබෙන දේට අභියෝග කර ඇති ප්‍රමාණයට ඉදිරිපත් කර තිබෙන සිද්ධාන්ත බොළඳ (preposterous) බව පරීක්ෂාවෙන් කියවන පාඨකයාට ඉක්මණින් පෙනී යයි. එය පටු විවාද සන්දර්භයෙන් (Context) වෙන්කර ගත් විට දිස් වන්නේ වෙනත් අයුරකිනි. මේ වෘත්තීය වාද විවාද (local controversies) සහ නො ඉවසුම්ගති (tension) ගැන නොදන්නා පාඨකයා, නාම මාත්‍ර වෙනස්කම් පිළිබඳව අර්ථ ශූණය වාග් හරඹ (quibbling) මගින් "වැරදි" විශාල කර දැක්වීම සහ අන්‍යයන් විසින්කර තිබෙන සමාන සොයා ගැනීම් සඳහන් නොකර හැරීම දක්නට අසමත් නොවනු ඇත. ඥාති සම්බන්ධ ක්‍රම වටහා ගැනීමට පුළුවන් වන්නේ ඊට සම්බන්ධ ප්‍රදේශය අනුව මෙන් - ආචාර්ය ලීච් ගේ "සොයා ගැනීම් වලින්" එකක් - මානව විද්‍යාත්මක සිද්ධාන්ත අර්ථවත් වන්නේ ඒවාට හිමි දේශීය පරිසරය තුළ පමණි.

මගේ දැඩි චෝදනා බොළඳ බව නොපෙනීම සඳහා ආචාර්ය ලීච්ගේ ලේඛණයෙන් ගත් සාධක වලින් ඒවා යුක්ති යුක්ත බව පෙන්වා දීමට කැමැත්තෙමි. බොහෝ මානව

විද්‍යාඥයෝ සමාජ ව්‍යුහය සහ ස්වාභාවික පරිසරය වෙන් කර ගනිති"යි යනුවෙන් ඔහු කරන චෝදනා මුලින්ම දැනගන්නට කැමැත්තෙමි. එවන්ස් ප්‍රිචාර්ඩ් "ද නුඅර්" (The Nuer) නැමැති කෘතියෙහි පරිසර - විග්‍රහය (analysis of ecology) සමාජ - ව්‍යුහය" පිළිබඳ විග්‍රහය සමග සම්බන්ධ කර ගැනීමට පැහැදිලිවම උත්සාහ කර තිබේ. ඔහුගේ පොතෙන් භාගයක් ස්වාධීන කොටසක් වන අතර අනික් කොටස නොමැතිව එය තේරුම් ගත හැකිය. කර්තෘට කළ හැකිව තිබුණේ වෙන කුමක්ද? සිය විවරණය සඳහා ඔහු තම ග්‍රන්ථය පරිච්ඡේද දෙකකට බෙදීය: එක පරිච්ඡේදයක විස්තර කෙරෙන්නේ එක් විශේෂ විෂයක් ගැන පමණි. ඒ පරිච්ඡේද දෙකේ තිබෙන කරුණු වල ඇති අන්‍යොන්‍ය සම්බන්ධය "නිගමනය" යන මැයින් වෙනම විස්තර කළ හැකිය.පොතේ පෙරවදනෙහි "පොත පරිච්ඡේද වලට බෙදා ඇති බවක් එහි ඇතුළත් කරනු අන්‍යොන්‍ය සම්බන්ධයකින් යුක්ත බවත්" සඳහන් කිරීමට ඔහුට පුළුවන. එසේ සඳහන් නොවුවහොත් සෑම කොටසක්ම ස්වාධීන විවරණයක් ලෙස නිසැකවම සැලකිය හැකිය.

විවරණය උදෙසා ඇතැම් විට සක්‍රිය අවශ්‍යතා කැප කිරීමට සිදු වේ. තවද, සමාජයක ඇතැම් කොටස් වෙන් වෙන්ව සළකා බැලිම යෝග්‍යය. උදාහරණ: කර්මාන්ත ශාලාවක් හෝ ව්‍යාපාරයක්, පාසැලක් හෝ විශ්ව විද්‍යාලයක්, කණ්ඩායමක් හෝ වැඩ කරන සමූහයක් ගමක් හෝ කුඩා ගමක් ආදී සෑම දෙයක් සෙසු සියලු දේටම සම්බන්ධ නිසා සමස්තයම එකට ගෙන සැලකිල්ලට භාජනය කළ යුතු යැයි කියා සිටීම පලක් නැති කියමනකි. ඇත්තෙන්ම ආචාර්ය ලීච්ගේ තර්කය නිරවද්‍ය නම් ඔහු විසින් කර තිබෙන විෂය අධ්‍යයනයෙහි ඇතැම් අවස්ථාවල සමස්ථයට ඇති සම්බන්ධය හඟවන නමුදු එක් ගමක් ස්වාධීන ඒකකයක්ලෙස විග්‍රහ කිරීම නිසා, ඔහුගේ අධ්‍යයනයට ද අභියෝග එල්ල කළ හැකිය. එහිදී "1954 හි උතුරු මැද පළාතෙහි සිංහල ගැමියන්ගේ චාරිත්‍රානුකූල හැසිරීම්" ගැන, "සිංහලයන්ගේ ඒ තත්ත්වය"[38] (Sinalese situation) ගැන, සහ "බාහිර ලෝකය සමග පැවැති ගැමියන්ගේ සම්බන්ධය" ගැන[39] ඔහු සඳහන් කරයි. ආචාර්ය ලීච් ගේ උපදෙස් අනුව, අපි ප්‍රථම මූලධර්ම වෙත හැරෙමු. දැන් සංකල්ප පිළියෙළ කරගනු ලැබීමේ දී හෝ යෝග්‍ය කල්පිත ප්‍රමාණය නිර්ණය කර ගැනීමේ දී හෝ අප විසින් ඒවායේ සීමාවන් නියම කරගත යුතුය. ප්‍රථම මූලධර්ම රැඩ්ක්ලිප් බ්‍රවුන් තේරුම් කර දුන් අතර, ඒවා උපයෝගී කර ගැනීමේ දී ඉවසීමෙන් සහ සිහි නුවණින් යුක්ත විය යුතු බව ඔහු උදෙක්ම ඉල්ලා සිටියේ ය.

"අධ්‍යයනයක් සඳහා, යම් ක්‍රමයක සීමා රේඛිත කර ගන්නේ කොතැනින්ද? සමස්තයේ සියලු දෙයින්ම "ක්‍රමය" (system) වෙන් වී පවතින බව මතක තබා ගත යුතුයි. සියලුම විද්‍යාවන්හි, විද්‍යාඥයා තැත් කරන්නේ ඔහු අධයයනය කරන දේ එහි පරිසරයෙන් සංකල්පමය වශයෙන් වෙන් කර ගැනීමටය. කිසියම් ප්‍රමාණයකට .... එබඳු විවික්තතා අත්තනෝමතියක: නමුත් සමහර විවිත්තතා යෝග්‍ය වන අතර, සමහරක් යෝග්‍ය නොවනු ඇත. විද්‍යාවේ ක්‍රමය වූ කලී විවිත්තතා ඇතිකර ගත යුත්තේ කවර අවස්ථාවලදී ද යන්න දැන ගැනීමය. විද්‍යාඥයාගේ නිපුණත්වය තිබෙන්නේ යෝග්‍ය දේ සහ යෝග්‍ය නොවන දේ වෙන්කර දැන ගැනීමේ හැකියාවෙහිය. එයින් ඔහුගේ පර්යේෂණයෙන් කියන ප්‍රතිඵල ලැබීම සහිතික වේ. ඒ නිපුණත්වය විසින් හොඳ විද්‍යාඥයකු කරන විද්‍යාඥයකු ගෙන් වෙන් කර දක්වන්නේ, ඒ සඳහා එක්තරා ප්‍රමාණයක ප්‍රතිභාගයක් (intuition) තිබිය යුතුය.

....... ඇතැම් දෘෂ්ටි කෝණ අනුව මුළු එක්සත් ජනපදයම එක් ඒකයක් වශයෙන් ගැනීම පහසු වනු ඇත. කිසියම් දේශපාලන ප්‍රශ්ණ සළකා බලන්නේ නම් එය නිසැකවම එසේ ගත යුතුය. අනිත් අතින්, ආර්ථික ආයතනය සළකා බැලීමේ දී අද මුළු ලෝකයම සමාජයක් වේ. තවද, වෙනත් සමහර සමාජ ප්‍රශ්ණ සළකා බැලීම සඳහා මුළු එක්සත් ජනපදය ඉතා විශාල වේ. ඒ නිසා අප විසින් කළ යුත්තේ අපට වෙන්කර ගත හැකි කුඩා ප්‍රජා සමූහයක් ඒකකයක් වශයෙන් ගෙන, එය විග්‍රහ කර, ක්‍රමයක් (System) ලෙස අධ්‍යයනය කිරීමය.[41]

ඒකකය තෝරා ගත් පසු, නොවෙනස්ව පවත්නා (constants) ඇතැම් චර්යා වෙන් වෙන්ව විමසීම ප්‍රයෝජනවත් වනු ඇත. නිදසුනක් වශයෙන්, ඉඩම් භුක්තිය සහ/ හෝ ඥාති සම්බන්ධතා උදෙසා දේශපාලනික චයඝීයි. ඇත්ත වශයෙන්ම සමාජයන්හි විවිධ අංශ කිට්ටු අන්‍යෝන්‍ය සම්බන්ධයකින් යුක්තය. නිදසුනක්ඃ (ඉන්දියාවේ) ඕරිසා (Orissa) පෙදෙසේ ඉඩම් විකිණීම පිළිබඳ විශ්ලේෂණයක් සඳහා එහි මුළු සාමාජික ආර්ථික සහ දේශපාලනික රටාව අධ්‍යයනය කිරීම අවශ්‍ය වූ බැව්ද බෙයිලි (Bailey)[42] පෙන්වූයේය. එහෙත් වෙනත් සමාජයන්හි පවතින ඒ අන්‍යෝන්‍ය පරායත්තාව ඉතාම අඩුය. තවද, එකම මිනිසා විවිධ චරිත නිරූපණය කරන නමුදු, අපි චරිත (roles) සංකල්පනය කර ඒ ගැන කථා කරමුඃ ඒවා නම්කර සෑම චරිතයක්ම වෙන් වෙන්ව විශ්ලේෂණය කරමු. ස්වකීය අධ්‍යයන ඒකකය සම්බන්ධයෙන් ද සිය දත්ත සළකා බැලීමට යෝග්‍ය විවිත්ත ප්‍රමාණය (degree of abstraction) සම්බන්ධයෙන් ද ආචාර්ය ලීච් ඇතැම් තීරණවලට එළඹී ඇත. මගේ චෝදනාව, ඔහු එම නිගමන යෝග්‍යතාව මත ගත් බව නොසළකා, ඒ නිගමන පමණක් යුක්ති සහගත බවත් ඒ නිසා ඒවා සියලු දෙනාම අනුගමනය කළ යුතු බවත් සැළකීමය.

දැන් සිය සොයා ගැනීම් වලට සමාන වෙනත් අයගේ සොයා ගැනීම් පිළිගැනීම (ආචාර්ය ලීච්) නොසලකා හැරීම කෙරෙහි මගේ අවධානය යොමු කරමි. එය සුළු වරදක් වුවද සංකල්ප, සිද්ධාන්ත සහ "අන්තර්ඥාන" (intuition) පද්ධතියක් සකස් කර ගැනීම හා ගැටේ ඔහු "ප්‍රබල" (effective) පවුල වෙන් කර දක්වන්නේ[43] "ප්‍රබල" (effective) සහ "ප්‍රබල නොවූ" (non-effective) ඡාති පිරිස් අතර පත් (Firth) සහ ඩිජමූර් (Dijamour)[44] විසින් දක්වනු ලැබූ වෙනස පිළිබඳ කිසිදු සඳහනක් නොකරමිනි. අවසාන වශයෙන් "මේ සමාජයෙහි, නෑකම් ක්‍රම" ස්වාධීන දෙයක්" (thing in it self) නොව ඉඩම් සම්බන්ධ අයිතිවාසිකම් සහ ව්‍යවහාරයන් (usages) පිළිබඳව සිතනු ලබන ක්‍රමයකි[45] යි යන අනු මතය "ආචාර්ය ලීච් දරයි. මේ මතය අලුත් එකක් හෝ අනුචිත එකක් හෝ නොවේ. එය ප්‍රකට සමාජ විද්‍යාත්මක කියමනකි. කුවරුත් දන්නා සමාජ වවිද්‍යාත්මක කියමනක් වන එය, මැක්අයිවර් (maciver) විසින් කලින් පල කරනු ලැබූ විභාග පොත්වල ප්‍රකටම දක්නට ලැබේ. ප්‍රජා සමූහයක හරය එය පිහිටි ස්ථානය"යි යන සාමාන්‍ය කියමනක් ලෙසයි එහි සඳහන් වී තිබෙන්නේ. මේ ලිපියේ කර්තෘ විසින් නෑකම විවාහය සහ ඉඩම් අතර පවත්නා සබඳතාව ඉතා නිශ්චිත ලෙස පැහැදිලි කිරීම පිණිස සවිස්තරව සාධක ඉදිපත් කර තිබේ.[46] සාමාන්‍යයෙන්, නෑකමට මෙන්ම විවාහයටත් විවිධ කාර්ය (functions) තිබිය හැකිය. එයින් ඕනෑම එකක් සමාජයක ප්‍රධාන තැනක් ගන්නට පුළුවන.[47] පුල් එලියෙන් ප්‍රධාන සක්‍රිය සම්බන්ධතා (functional relationslip) පැවතුනේ නෑකම (Kinship) සහ ඉඩම් පිළිබඳ අයිතීන් අතරය.

යථෝක්ත ලේඛණයෙහි මා නොසන්සුන් කළ එක් කරුණක් නම් අධ්‍යයනය කරනු ලැබූ ඔවුන්ගේ ගම නිර්නාමික නොවීම හෝ ව්‍යාජ නමකින් හැඳින් නොවීමය. මෙය සාධාරණ ද? ජන සමූහයකගේ පෞද්ගලික ජීවිත.ය ලෝකයට අනාවරණය කර ඔවුන්ට හුදෙක් ස්තුතියි සහ කණගාටුයි" කියමින් කර්තෘට සෑහීමකට පත්විය හැකිද? ඇත්ත

වශයෙන් එවැනි තත්ත්වයක සිටින්නේ මේ කර්තෘ පමණක් නොවේ. තම සඳහන් කරනු ලැබූ ගමක් පිළිබඳ මෑත දී කරන ලද අධ්‍යයනයකදී රයන් (Ryan) පුද්ගලයන්ගේ ඡායාරූප ගණනාවක්ම ඇතුල් කළේය. ඒ ක්‍රියාව ඔහුට එක්සත් ජනපදයෙහි කළ හැකි වේද? යුරෝපයෙහි සහ එක්සත් ජනපදයෙහි මානව විද්‍යානුකූල අධ්‍යයන කිරීමට අවකාශ නොමැති බව නොව, සැක නොකරන පුද්ගලයන් විසින් අපහාසයට නඩු පවරනු ලැබීමේ අනතුරෙන් ආරක්ෂිත ඌණ සංවර්ධිත රටවල ජනයාගේ පැටලිලි සහිත ඉතා කිට්ටු සම්බන්ධතා පිරික්සීමට ධනවත් පදනම්වලින් මුදල් ලබා ගැනීමට විද්වතුන්ට පුළුවන් වීමය. මෙවැනි තත්ත්වයක අපට ජීවත් විය හැක්කේ විද්වතුන්ගේ ආකල්පයෙහි වෙනසක් සිදු වෙතියි නැත්නම් පරීක්ෂණයට භාජනය වන්නන් විසින් විරෝධය ප්‍රකාශ කරනු ලබතියි යන බලාපොරොත්තුව ඇතිවය. තම පෞද්ගලික අන්තර්ඥාන සනාථ කිරීම පිණිස සාධක සොයන මානව විද්‍යාඥයන් විසින් ලෝකයේ "ම්ලේච්ඡයන්ගේ" (Savages) පෞද්ගලික ජීවිත අයුතු ලෙස හාරා බැලීමට එරෙහිව ලෝකයේ ම්ලේච්ඡයන් (savager) එකතු වී කැරලි ගැසීමට කාලය පැමිණ නැද්ද?[49]

මා මෙහි සඳහන් කර ඇති අදහස් මානව විද්‍යාව ගැන අප්‍රසාදයට පත්වීමේ දෘෂ්ටියක් සේ පෙනේ නම්, ආචාර්ය ලීච්ගේ උත්කෘෂ්ඨ ග්‍රන්ථය, මානව විද්‍යාව සහ සමාජ විද්‍යාව ඇත් කර තබන "දූෂණ බිය" (Cerruption Complex) ඉක්මවා යෑම නිසා සමාජීය විද්‍යාවන් සඳහා නව බලාපොරොත්තු ඇති කරවන බව මවිසින් නිගමනය කළ යුතු වේ.

සමාජ විද්‍යාඥයා උදක්ම සැලකිල්ල යොමු කරන්නේ සංඛ්‍යා ක්‍රමයට හා ප්‍රමාණාත්මක දත්ත කෙරෙහි යයි කියා සිටින්නන් (ඔහුත් ඇතුලුව) ඔහු වික්ෂිප්ත කර ඇත.[50] ඇත්ත වශයෙන්ම ඔහුගේ පුල් එළිය යන කෘතියෙන් බලාපොරොත්තු නොවූ කාරණයකි, "සංඛ්‍යාන" (statistic) පිළිබඳ කර්තෘගේ සංකල්පය අවුල් සහිත වුවද; ප්‍රමාණාත්මක අධ්‍යයන (quantitative studies) කිරීමට මානව විද්‍යාඥයන්ට අයිතිය තිබෙන බව ඔහ විසින් පිළිගනු ලැබීම. මානව විද්‍යානුකූල අධ්‍යයනයෙහි සංඛ්‍යාන දත්ත සහ ක්‍රම පිළිබඳ සිරිනිවාස කර ඇති ඇගැයීම ඉතාමත්ම පැහැදිලිය:

.... වෙනස් වූ සමාජ දෙකක මව ගේ සොහොයුරාගේ දුවට කැමැත්තක් දැක්වූ බව පැවසීම කලින් ප්‍රමාණවත් වූ නමුදු, අද මානව විද්‍යාඥයා සොයන්නට තැත් කරන්නේ ඒ සමාජ දෙකෙහි සිදුවී ඇති විවාහ අතුරෙන් මවගේ සොයුරාගේ දුව සමග සිදුවී ඇති විවාහ කොපමණ ද යන්නයි. එය 'සමාජයේ සෙසු ආයතනවලට සම්බන්ධ කිරීමට ද ඔහු උත්සාහ කරනු ඇත. සිදු වූ විවාහ සංඛ්‍යාව හැකිනම් විමසා බලා, මවගේ සොයුරාගේ දුව විවාහ කර නොගත් අයට පණවන තහංචි කවරේද යන්නත් ඔහු සඳහන් කරයි. අද මානව විද්‍යාඥයා මිනිසුන්, පශුන්, නිවාස සහ ඇතැම් විට රැකියා සංගණනය කරයි. කොටින් කියහොත් සමාජ මානව විද්‍යාව නිශ්චිත වශයෙන්ම සමාජ විද්‍යාවේ නම්‍යතාව වැළඳ ගැනීමක් සමග ප්‍රමාණ කිරීමේ (quantification) අවශ්‍යතාවය වැටහී ගොස් තිබේ. සමාජ මානව විද්‍යා ක්ෂේත්‍රයට විශාල ගම්, නගර කර්මාන්ත ශාලා සහ ප්‍රදේශ ද පිළිබඳ අධ්‍යයන පිවිසීමත් සමග සංඛ්‍යානාත්මක ක්‍රම වැඩි වැඩියෙන් උපයෝගී කර ගතයුතු වේ... ප්‍රමාණීකරණය උපයෝගී කර ගත යුත්තේ අවශ්‍ය වූ අවස්ථාවල දී පමණක් විනා එය පූජනීය (felish) දෙයක් සේ සළකා නොවේ. සංඛ්‍යාන උපයෝගී කර නොගත් අධ්‍යයනයකින් ඉතාම හොඳ අවබෝධ ඇති විය හැකිය.[51]

දූෂණය වීම සහ බුද්ධිය අවුල්වීම පිළිබඳ අතිසි බියෙන් තොරව තම විද්‍යා ක්ෂේත්‍රයෙන් පිටත සිටින්නන්ගේ බුද්ධිමත් දෘෂ්ටීන්, සංකල්ප සහ ක්‍රම උපයෝගී කර ගැනීම මානව විද්‍යාඥයින් දිගටම කර ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. එබඳු ප්‍රවණතාවක් රැඩික්ලිප් බ්‍රවුන් ගෙන් ඇරඹුණි: ඔහු මානව විද්‍යාඥයකු වශයෙන් පිලිගැනීමට අවශ්‍ය සුදුසුකම් නොතිබුණ ද පුටුවකට සීමා වී සමාජ විද්‍යා, අධ්‍යයන කළ සමාජ විද්‍යාඥයෙකු වූ දුර්බයිම්ටනැඹුරු වීමට පසුබට නොවීය.

"පරම කල්පිත වර්ගී" (ideal types) පිළිබඳව මැක්සි වෙබර් (Max Weber) විසින් කර තිබෙන විග්‍රහය ආචාර්ය ලීච් දැන සිටියේ නම් ඔහුගේ යථාර්ථීය අනුභූතියේ[63] සම්පූර්ණ නිරවද්‍ය තාවයට සාපේක්ෂව වියලි කලාපය පිළිබඳ තිබෙන අධ්‍යයනයන්ගේ කල්පිත ස්වරූපය (idcalise nafure) ගැන ඔහු කර ඇති විමශීන යෙහි දන්නා අවුල් සහ වැරදි නිරූපන බොහෝමයක්ම මඟ හරවා ගත හැකිව තිබුණි. "වර්ගී" (typology) කෙරෙහි ඔහුගේ විශ්වාසයක් නොමැති නම් එක් ගමක් පිළිබඳ නිවැරදි විස්තරයක් සම්පූර්ණ කර ගත හැකි නම්, ඒ නිවැරදි විස්තරයකට ඕනෑම විචිත්ත කල්පිත විමර්ශනයක් සමාන නොවන බව වටහා ගැනීමට වෙබර් වෙත යෑම අවශ්‍ය නොවේ. මේ අනුව සිංහල ගමක්[55] පිළිබඳ මා කර ඇති වවිස්තර විවික්ත එක කි. බේඩන් පවල් (Baden Powell) විසින් ඔහුගේ "ඉන්දියානු ගම" (indian Village) නැමැති සම්භාවනීය කෘතියට සැපයූ පෙර වදනෙහි සඳහන් කරන ලද පරිදි "ගමක් පිළිබඳ" විවික්ත වූත්, ඒකාබද්ධ වූත් සංකල්පයක අනිවාර්යයෙන්ම ඇති විය හැකි වැරදි මඟ හරවා ගැනීම කළ නොහැකිය. එහෙත් සිද්ධාන්තමය දෘෂ්ඨිය අතිනුත් ප්‍රායෝගික දෘෂ්ඨිය අතිනුත් එවැනි විවික්ත කල්පිත ආචාර්ය ලීච් සඳහන් කරන "අධික විස්තර" (excessive detail) මෙන්ම ප්‍රයෝජනවත් විය හැකිය.

## සටහන්

1. විචාරයට ලක් වී ඇති කෘතිය ඊ. ආර්. ලීච් ගේ
1. The study in question is Pul Eliya, A Village in Ceylon, by E. R. Leach Cambridge University Press, 1961
2. Phyllis Karberry, Malinowski's Contribution to Fieldwork Methods and Writing of Ethnography in man and Culture, ed. Raymond Firth, London, Routledge & Kegan Paul, 1957.
3. Evans Pritchard was guilty of rank heresy when he stated that Marcel Mauss, in his essay on the gift, was able to gain the same kind of insight which anthropologists derive in the field, from his flat in Paris.
4. Throughout this paper I refer to social anthropology, although using the abbreviated anthropology. The first university chair which bore the title social anthropology was an honorary professorship held by Sir James Frezer at Liverpool University in 1908, cf E.E. Evans Pritchard: Social anthropology, London, Cohen & West, 195, p. 3.
5. cf. Evans Pritchard, op.cit, p. 76.
6. Althought it persists, "I think that many were able to accept and talk to a stranger in a frank and honest way that would have been impossible among themselves" R. E. Cole, Japanese Blue Collar, University of California Press, 1971,p. 44.
7. In fact the venue of Dr. Yalman's major anthropological exploits was a village in the Wet Zone (Teripeha, Walapane District) cf. Nur Yalman. The Flexibility of Caste Principles in Kandyan Community in Aspects of Caste in South India, Ceylon and North west Pakistan, Cambridge papers in Anthropology. ed. E. R. Leach, 1950, pp. 78-112.
8. I find it disconcerting that much of what Dr. Leach claims to be obvious is far from being obvious to me, while what he considers unexpected is pretty obvious.
9. cf. Leach, Magical hair, J. Royal Anthropological Institute, 88/1, 1958.
10. Evans Pritchard. The Nuer, Oxford University Press, 1940, preface,
11. Leach. Pul Eliya. p. 12.
12. Bryce Ryan in collaboration with L. D. Jayasena & D. C. R. Wickremasinghe, sinhalese Village, University of Miami Press, 1958, pp. v-cii.
13. The late Professor D. N. Majumdar of Lucknow once complained that an American anthropologist who had produced a voluminous book on an Indian village, complete with pretty photographs, had not slept a single night

in that village, and depended entirely on student interviewers for his information. And students are readily available in countries having high rates of graduate unemployment. At a time when Foundations are anxious to promote research in "applied anthropology" the whole business of 'rapport' becomes a matter of intellectual chicanery. Srinivas has described a new type of academic structure headed by a Director who is an academic entrepreneur who has succeeded in securing research funds, while at the base of the hierarchy are postgraduate students who are made to do the dirty work of collecting data through questionnaires drafted by the middle ranks of the hierarchy. Needless to say, the report is ascribed to the Director, who and little to do with the actual research.

14. Ryan, op, cit, p. 48.
15. Leach, Pul Eliya, pp 67-78
16. ibid.., p. 157
17. Leach, An Anthropologist's Reflections on a Social Survey. Ceylon J. Historical and Social Studies. 1/1, 1958. The survey in question was the Distintegrating village by N.K. Sarkar & S. J. Tambiah, Ceylon University Press Board, 1957.
18. Leach. Pul Eliya. p. 8.
19. ibid., p. 121
20. ibid., pp., 82, 83
21. ibid., ;. 152, Map E.
22. ibid., p. 90.
23. ibid., p. 12.
24. The chief offenders among writers on Ceylon are R. W. Levers., H.W. Condrington and R. Pieris. Among anthropologists , the idealists include Evans Pritichard, Meyer Fortes and J. C. Mitchell ibid., 305.
25. Leach, An Anthropologist's Reflections...', cit, supra p. 106.
26. Leach, Pul Eliya, p. 126.
27. Dorothy Emmet, how Far Can Structural Studies Take Account of Individuals? J. Royal Anthrop. Institute, 90, ii 1960.
28. Leach, Pul Eliya. p. 8.
29. Evans Pritchard, The Nuer. p. 38.
30. Leach; Political systems of Highland Burma, London, G. Bell. 1954, p. 282.
31. A. R. Radciffe Brown, A natural Science of Society, Glencoe. The Free Press. 1957. pp. 61-62.
32. Ralph Pieris, Sinhalese Social Organization. The Kandyan Period, Ceylon University Press Board, 1956, p. 6.
33. Pul Eliya, p. 12.
34. ibid., p. 12.
35. ibid., p. 305
36. Thus Pieris Sinhalese Social Organization, p. 26, states "the artificial divisions of the book tend to obscure the fact that the various parts of the social system are functionally interrelated."
37. Leach' Pul Eliya. p. 96.
38. ibid., p. 94.
39. ibid., p. 30-33.
40. ibid., p. 304
41. Radciffe Brown. op. cit. pp. 61, 62.
42. F. G. Bailey, Caste and the Economic Frontier Manchester University Press, 1957.
43. Leach, Pul Eliya. p. 113.
44. Raymond Firth & Judith Djamour, Kinship in South Borough , in Two Studies of Kinship in London, University of London : The Athlone Press, 1956, p. 45.
45. Leach, Pul Eliya. P. 146.
46. Pieris op. cit, pp. 209-210.
47. For a discussion of the various functions of marriage cf. leach, Polyandry, Inheritance and the Definition of Marriage, Man, No. 199, 1955.
48. Ryan, op. cit.
49. In situations where visible paper and pencil are inadvisable, an anthropologist says, "I take notes in a pocket of my pants or jacket"! W. J. McEwen. A technique for Ethnographic Note - taking Amer, Anthrop., 61/iv. 1959.
50. Leach, "An Anthropologist's Reflections...." cit supra.
51. M. N. Srinivas Social Anthropology and the Study of Rural and Urban Societies. Econ., Wkly, Bombay. XI 4-6, 1959.
52. cf. W. R. G. Horton, Social Science, Logical or Psychological Impossibility ? Man. LXI/4.
53. Leach. Pul Eliya. p. 2.
54. Max Weber. The Theroy of Social and Economic Organization, Glencoe: The Free Press, 1947.
55. Pieris, op, cit, Part II.